# මොනරාගල ප්‍රාදේශීය සභාව
# 2021.03.17 දින මහ සභා වාර්තාව

මොනරාගල ප්‍රාදේශීය සභාවේ 2018 වර්ෂයේ නිළ කාලය ආරම්භ කිරීමෙන් පසුව පවත්වනු ලැබූ තිස් හය වන (36) සභා වාරය 2021.03.17 වන දින ප.ව 02.30 ට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී ගරු සභාපති ආර්.එම්.රත්නවීර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. එහි සංෂිප්ත වාර්තාව පහත සඳහන් කරමි.

**පැමිණීම**

| | | |
|---|---|---|
| 01. ගරු සභාපති | - | ආර්.එම්.රත්නවීර මැතිතුමා |
| 02. ගරු උප සභාපති | - | ආර්.එම්.ප්‍රදීප් විජේරත්න මැතිතුමා |
| 03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | වයි.උපුල් මැතිතුමා |
| 04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩී.සුනිල් අරංගල මැතිතුමා |
| 05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.ක්‍රිශාන්ත රත්නායක මැතිතුමා |
| 06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ජී.ඩී. චාමර නානායක්කාර මැතිතුමා |
| 07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.එම්.ගුණවර්ධන මැතිතුමා |
| 08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | රංජිත් රත්නායක මැතිතුමා |
| 09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | තරංග දිසානායක මැතිතුමා |
| 10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | තමෝදිරම් ජයජීලන් මැතිතුමා |
| 11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | සන්ධ්‍යා අනුරුද්ධිකා රත්නායක මැතිතුමිය |
| 12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.අතුල කුමාරසිරි මැතිතුමා (ප්‍රතිපක්ෂ නායක) |
| 13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ප්‍රදීප් ධම්මික විතානගේ මැතිතුමා |
| 14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.රමණී රත්නායක මැතිතුමිය |
| 15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.උදේනි රම්‍යලතා මැතිතුමිය |
| 16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.මනෝජා ලක්මිණී මැතිතුමිය |
| 17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.සනත් ගුණවර්ධන මැතිතුමා |
| 18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.එම්.පී.බණ්ඩාර මැතිතුමා |
| 19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | අජිත් ශාන්ත අගලකඩ මැතිතුමා |
| සභා ලේකම් | - | ඩී.එම්.අනුර දිසානායක මහතා |

පළමුව ආගම සිහිකිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් මාසික මහ සභාව සාර්ථක කර ගැනීම සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා, සියලුම මන්ත්‍රිවරුන්, මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටින සියලු දෙනා පිළි ගනිමින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

## 01. පසුගිය මස සභා වාර්තාව සභා සම්මත කර ගැනීම.

මේ වන විටත් ඔබතුමන්ලාහට ලබා දී ඇති පසුගිය මාසික මහ සභාවේ සභා වාර්තා කෙටුම්පත කියවූවා සේ සලකා සංශෝධන ඇත්නම් ඒවා පෙන්වා දී සංශෝධන නැත්නම් ගරු සභාවේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත කර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු සභාව වෙත දැනුම් දෙන ලදී.

ඉන් අනතුරුව සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූ බැවින්, සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමන්ගේ සහ ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් පසුගිය මස මහ සභා වාර්තාව සභා සම්මත කරන ලදී.

## 02. සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන

නැත

## 03. සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව වෙත ඉදිරිපත් කිරීම.

**ඉදිරිපත් වී නොමැත**

## 04. යථා පරිදී කල් දී ඇති ප්‍රශ්න සාකච්ඡා කිරීම

**නැත**

## 05. යථා පරිදී කල් දී ඇති යෝජනා සාකච්ඡා කිරීම

න්‍යායපත්‍රානුකූලව මීලඟට ඇත්තේ යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීම හා සභා තීරණ ගැනීම බව ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

## 5.1. ගරු සභාපති ආර්.එම්.රත්නවීර මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා

**යෝජනා අංක 01**

මොනරාගල, වැදිකුඹුර, අළුත්වත්ත පදිංචි එස්.එම්.කරුණාරත්න මහතා විසින්, බෝහිටිය වසමට අයත් අලුත්වත්ත ප්‍රදේශය දක්වා කුඹුක්කන් ඔය ජල ව්‍යාපෘතිය මගින් ජලය ලබාදීම සඳහා අදාල කාණු කපා නළ පද්ධතිය යොදා ඇති නමුත්, එම මාර්ගයේම තමන් ඇතුළුව තවත් පවුල් 05 ක පමණ ජීවත් වන්නන් හට ජලය ලබාදීමට කටයුතු කර නොමැති අතර, මීටර් 200 ක් පමණ වන එම කොටස වෙනුවෙන් ජලය ලබා ගැනීම සඳහා සභාව මගින් කාණු කපා සකස් කර දෙන ලෙස කර ඇති ඉල්ලීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට තරංග දිසානායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

කාර්මික නිලධාරි මහතා යොදවා පරීක්ෂා කර බලා මේ වන විට ඇවිත් තිබෙන බට වලින් මෙම පවුල් 05 වෙනුවෙන් නළ පද්ධතිය දීර්ඝ කර ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දීම සුදුසු බව මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**යෝජනා අංක 02**

මොනරාගල ප්‍රාදේශිය සභාවේ 2020.11.13 වන දින සිට ආදායම් පරීක්ෂක තනතුරෙහි කටයුතු කරනු ලබන තිලිණි රාවතාවත්ත මහත්මිය විසින් ආදායම් පරීක්ෂක තනතුරට හිමි පරිවර්තිත ගමන් වියදම් දීමනාව ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම සඳහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයපීලන් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම නිලධාරිතුමිය විසින් අදාළ ක්ෂේත්‍ර රාජකාරි නිසි අයුරින් සිදු කර ඉදිරි වැඩසටහන් සහ කළ වැඩසටහන් නිසි අධීක්ෂණයන් යටතේ සිදුවනවා නම් රු.3500.00 ක පරිවර්තිත ගමන් වියදමක් මෙම මස සිට මාසිකව සහා අරමුදලින් ලබා දීමට කටයුතු කිරිම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**යෝජනා අංක 03**

මොනරාගල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය වෙත ඩෙංගු මර්ධන කටයුතු සඳහා අනුයුක්ත කර ඇති සහායකවරුන් 05 දෙනා දිනපතා කණ්ඩායම් වශයෙන් ක්ෂේත්‍රයේ නිවාස 100 ක ඩෙංගු පරීක්ෂා කිරීමේ කටයුතු සඳහා යොදවා ඇති බවත් ඒ මගින් මේ වන විට ප්‍රදේශයේ ඩෙංගු රෝගීන් බෝ වීම හඳුනා ගැනීමට හා පාලනය කර ගැනීමට හැකිවන බවත් සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී විසින් අප වෙත දන්වා ඇති අතර මෙම සහායක වරුන් වෙත ප්‍රවාහන පහසුකම් සැලසීම අපහසු බැවින් ඔවුන්ගේම යතුරු පැදිවලින් ක්ෂේත්‍ර කටයුතු සිදු කරන අතර මෙම කණ්ඩායම් තුනට මසකට පෙට්‍රල් ලීටර් 05 බැගින් පෙට්‍රල් ලීටර් 15ක් ප්‍රාදේශිය සභාව මගින් ලබා දෙන ලෙස සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමා විසින් කර ඇති ඉල්ලීමට අනුව එය ලබාදීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමන්ගේ ඉල්ලීම මත ඉදිරිපත් කර ඇති මෙම කරුණු කාරණා සැලකිල්ලට ගෙන මෙම මස සිට නැවත දැනුම් දෙන තුරු සෑම මසකම පෙට්‍රල් ලීටර් 15 බැගින් ලබා දීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**යෝජනා අංක 04**

මොනරාගල ප්‍රාදේශීය සභාවට අයත් වාහන යන්ත්‍රෝපකරණ සඳහා අමතර කොටස් මිලදී ගැනීම, අළුත්වැඩියා සිදු කිරිම හා වාර සේවා සිදු කිරිම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී.

| අනු අංකය | වාහන අංකය | විස්තරය | මුදල රු. |
|---|---|---|---|
| 01 | 252-6330 | වීල් එලයිමන්ට් පරීක්ෂා කිරිම | 1900.00 |
| 02 | LL-7682 | වාර සේවා සිදු කිරිම | 18225.00 |
| 03 | LL-7682 | ටයර් රෝඩ් ෂාෆ්ට් එක මිලදී ගැනීම | 3950.00 |
| 04 | LL-7682 | ටයර් රෝඩ් ෂාෆ්ට් එක වැඩ කුළිය | 1600.00 |
| 05 | LL-7682 | ඉදිරි දොර ලොක් අළුතින් සවි කිරිම | 5500.00 |
| 06 | 49-5301 | බැටරියක් ලබා ගැනීම | 19500.00 |
| 07 | 49-5301 | ගියර් පෙට්ටිය අළුත්වැඩියා කිරිම වැඩ කුළිය | 8750.00 |
| 08 | 49-5301 | ටිපර් හෝස් එක අළුතින් සවි කිරිම | 2900.00 |
| 09 | RD-4488 | හිච් කොක්ක පිරවීම හා හිච් මුද්ද පිරවීම | 3300.00 |
| 10 | RS -1800 | ඇණ පොට කැපීම, නට් එකක් මිලදී ගැනීම රේඩියේටර් හෝස් එක සමග | 3350.00 |
| 11 | මාර්ග තලනය | ගියර් කේබල් එක අළුත්වැඩියාව | 1700.00 |
| 12 | RS-1800 | බටරි 2ක් මිළදී ගැනීම120A | 57000.00 |
| 13 | LM 3078 | ගලි රථය වාර සේවා කිරිම | 25880.00 |
| 14 | මාර්ග තලනය | වාර සේවාව සිදු කිරිම | 122006.44 |
| 15 | 252-6330 | පවර් ස්ටියරින් පොම්පය හා පවර් ස්ටියරින් බොක්ස් එක අළුත්වැඩියාව | 69750.00 |
| 16 | මාර්ග තලනය | ඩීසල් ටැංකි මූඩි 01, ඔයිල් මූඩි 01 | 28276.37 |
| 17 | GC 5148 | රේඩියේටරය අළුත්වැඩියාව දොර ලොක් දැමීම කාපට් දැමීම | 27000.00 |
| 18 | GC 5148 | වාහනයේ කැනපිය සීට් කුෂන් කර ලැලි දමා කවර දැමීම | 35000.00 |
| 19 | 49-5301 | ප්‍රධාන විදුලි ලාම්පුව, ඕල්ටනේටරය, උපකරණ මිලදී ගැනීම | 16600.00 |
| 20 | 49-5301 | ඩයොට් ප්ලේට්, ඕල්ටනේටරය අළුත්වැඩියා වැඩ කුළිය | 11390.00 |
| 21 | LL 6980 | පිටුපස දොර ප්‍රේම් එක අළුතින් යකඩ යොදා සවි කිරිම | 8500.00 |
| 22 | LL 6980 | වාර සේවා සිදු කිරිම | 36950.00 |

| | | | |
|---|---|---|---|
| 23 | RW 1980 | රිම්, රේසර් අමතර කොටස් දැමීම | 36730.00 |
| 24 | 49-5301 | ටිපර් හෝස් 01 හා බෝල් වැල් 01 | 3880.00 |
| 25 | PF 7419 | වාර සේවා සිදු කිරිම | 18150.00 |
| 26 | RC 1112 | ට්‍රැක්ටර් රථය, බ්‍රේක් පෑඩ්, ක්ලච් ප්ලේට්, ප්‍රධාන ලාම්පු අළුත්වැඩියාව | 24880.00 |
| 27 | RC 1112 | ට්‍රැක්ටර් රථය බ්‍රේක් පෑඩ් ක්ලච් ප්ලේට් අළුත්වැඩියාව | 32170.00 |
| 28 | RC 1112 | අළුත්වැඩියාව සහ හබ් ඔයිල් වීල් මිලදී ගැනීම | 2800.00 |

මෙම යෝජනාව සුදුසු බවට රංජිත් රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

නිසි ක්‍රමවේදයන්ට හා නිසි අධීක්ෂණයන්ට යටත්ව මෙම කටයුතු නිවැරදිව සිදු කර අදාළ මුදල් සභා අරමුදලින් ගෙවීම් කිරිම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**යෝජනා අංක 05**

පසුගිය මහ සභාවේ අවධානයට යොමු කරන ලද මොනරාගල සිරිගල ජයසූරිය මාවත කොන්ක්‍රිට් කිරිමේදී එහි තිබූ බෝක්කුවකට සහ අසල පැවති කාණුවකට සිදුවී ඇති හානිය මත එම ස්ථානය ඉතා අනතුරුදායකව පවතින බවට ප්‍රදේශවාසීන් විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සම්බන්ධව කාර්මික නිලධාරි මහතා යොදවා පරීක්ෂා කළ බවත්, එයට අනුව එහි පැති බැම්මේ කොටසක් කොන්ක්‍රිට් කර අළුත්වැඩියා කළ යුතු බවට ඔහු විසින් කරුණු ඉදිරිපත් කර ඇති අතර, එයට අදාළ රු.257,034.90 ක මුදලක් වැය වන බවට ඇස්තමේන්තුවක් ද සකස් කර ඇති අතර, මෙම අනතුරුදායක ස්ථානය මෙම ඇස්තමේන්තු ප්‍රකාරව සභා අරමුදලින් සිදු කිරිම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

කාර්මික නිලධාරි මහතා විසින් ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තු ප්‍රකාරව නිසි ක්‍රමවේදයන්ට යටත්ව මෙම අනතුරුදායක කොටස සභා අරමුදලින් සකස් කර දීම සුදුසු බවට මහ සභාව තීරණය කරන ලදී.

**යෝජනා අංක 06**

මොනරාගල, පට්ටියලන්ද හි ඇති සමිති ශාලාව ඉදිරිපිට ඇති පවුල් 10ක් පමණ පදිංචි කරුවන් සිටින මාර්ගය දැඩි සෝදා පාලුවට ලක්වී පා පැදියකටවත් යාමට නොහැකි තරමට අබලන් තත්ත්වයේ පසුවන බැවින් මෙම මාර්ගය කොන්ක්‍රීට් දමා පිළිසකර කර දෙන ලෙස එම ප්‍රදේශවාසීන් විසින් අත්සන් ලේඛණයක්ද සහිතව ඉල්ලීමක් කර ඇති බැවින් ඒ සඳහා සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට රංජිත් රත්නායක ගරු මන්ත්‍රිතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

කාර්මික නිලධාරි මහතා යොදවා පරීක්ෂා කර බලා මෙම මාර්ගය සකස් කරදීමට අවශ්‍ය කටයුතු සලසා දෙන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කර සිටි අතර, එය ලබාදීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**යෝජනා අංක 07**

මොනරාගල,රත්තනපිටිය කළුලන්ද මාර්ගය මේ වන විට පයින්වත් ගමන් කිරීමට නොහැකි තරමට ඉතා අබලන්ව ඇති අතර පාසල් ළමුන්, රාජ්‍ය සේවකයින් සහ ප්‍රදේශවාසීන් බොහෝ පිරිසක් භාවිතා කරන මෙම මාර්ගය සභාව සතු බැකෝලෝඩර් යන්ත්‍රයෙන් කපා සකස් කර දෙන ලෙස ප්‍රදේශ වාසීන් විසින් කර ඇති ඉල්ලීම ඉටු කරදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රිතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

නව මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මේ සඳහා රුපියල් ලක්ෂ 10 ක මුදලක් වෙන් කර ගත හැකි බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

**යෝජනා අංක 08**

ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP) යටතේ දෙවන අදියරය වශයෙන් ආදායම් උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු බවට මේ වන විටත් උපදෙස් ලබාදී ඇති අතර, පහත උප ව්‍යාපෘති 03 මෙම ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ ක්‍රියාත්මක කිරිමටත් එම යෝජනා 03 මීට පෙර සකස් කරන ලද පළාත් පාලන ආයතන සහභාගිත්ව සංවර්ධන සැලැස්මෙහි ප්‍රමුඛතම යෝජනා 03 ලෙස ඇතුළත් කිරිමටත් සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට

යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයශීලන් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

1) මොනරාගල නව බස් නැවතුම්පල අසල පොදු පහසුකම් මධ්‍යස්ථානයක් සමඟ වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම

2) පැරණි බස් නැවතුම්පොළ අසල රථ ගාලක් ඉදි කිරීම

3) මොනරාගල සිරිමාවෝ බණ්ඩාරනායක ළමා උද්‍යානය සංවර්ධනය කිරීම

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන මෙම ව්‍යාපෘතිය යටතේ මොනරාගල ප්‍රාදේශිය සභාවට ආදායම් උත්පාදනය කළ හැකි සහ බල ප්‍රදේශයේ කොට්ඨාස 10 ම නියෝජනය කරන සමස්ථ ජනතාව ම ප්‍රතිලාභ ලබා ගත හැකි වන පරිදි අත්‍යාවශ්‍යයෙන්ම සිදු කළ යුතු බවට දිස්ත්‍රික් දේශපාලන අධිකාරිය සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව මගින් ද අනුමැතිය ලබා දී හඳුනා ගෙන ඇති මෙම ව්‍යාපෘති 03 ක්‍රියාත්මක කිරිමේදී යටිතල පහසුකම් සකස් කර ගැනීමට මූල්‍ය දායකත්වය ද අදාළ අමාත්‍යාංශය මගින් ලබා දිය හැකි බව ද අප වෙත දන්වා ඇති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙහිදී මෙම කරුණු පිළිබඳව සාකච්ඡාවට බඳුන් කළ අතර, ඉදිරිපත් කර ඇති සංවර්ධන කටයුතු කාලීන වශයෙන් අත්‍යාවශ්‍යයෙන් ම සිදු කළ යුතු කාර්යයක් වන බවත් ඒවායින් ලැබෙන ප්‍රතිලාභ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ සිටින සමස්ථ ජනතාවට මෙන් ම පිටස්තරින් පැමිණෙන අය සඳහා ද සෘජුවම උපයෝගි වන බවත් පවසන ලදී. එලෙස ම මීට පෙර සකස් කරන ලද පළාත් පාලන ආයතන සහභාගීත්ව සිව් අවුරුදු සැලැස්මෙ හි ඇති මාර්ග සම්බන්ධයෙන් වන ව්‍යාපෘති රාශියක් දැනටමත් නව රජය යටතේ ක්‍රියාත්මක මාර්ග කි.මී.100000 ක අයි මාර්ග ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කිරිමට යොමු කර ඇති අතර, බොහෝ ජල ව්‍යාපෘති ඊට අදාළ ආයතන මගින් ක්‍රියාත්මක කිරිමට යොමු කර ඇති බවත් පවසන ලදී. එහෙත් මෙම සිව් අවුරුදු සැලැස්මට ඇතුළත් නොවූ අත්‍යාවශ්‍යයෙන් ම ඉටු කළ යුතු තවත් ව්‍යාපෘති ද්විතික නගර තිරසර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ද හඳුනා ගෙන ඇති අතර, එම ව්‍යාපෘතිය අවලංගු කිරීමත් සමග මෙම අත්‍යාවශ්‍ය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමට නොහැකි වී ඇත. එබැවින් බහුතර ජනතාවට සෘජුව ප්‍රතිලාභ ලැබෙන නගරයේ රථ වාහන නැවතුම් ස්ථානය, නව බස් නැවතුම්පොළ අංග සම්පූර්ණ පොදු වැසිකිළිය හා පොදු පහසුකම් සහිත මධ්‍යස්ථානය සහ කුඩා ළමුන්ගේ අවශ්‍යතාවය වෙනුවෙන්ම හඳුනා ගෙන ඇති සිරිමාවෝ බණ්ඩාරනායක ළමා උද්‍යානය සංවර්ධනය කිරිම යන සංවර්ධන යෝජනා මීට පෙර සකස් කර ඇති LAPDP සංවර්ධන සැලැස්මට ඇතුළත් කර එම යෝජනා ප්‍රමුඛ යෝජනා ලෙස ගෙන සංවර්ධනය කිරිමට කටයුතු කිරිම සුදුසු බවත්, මේ සඳහා ජනතාව රැස්කර අදහස් ලබා ගැනීම වෙනුවට ජනතාව නියෝජනය කරනු ලබන ගරු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය ලබාදීම සුදුසු බවටත් මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 5.2 ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ක්‍රිශාන්ත රත්නායක මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා

### යෝජනා අංක 01

මොනරාගල, මාගන්දනමුල්ල, 129/ඊ ග්‍රාම නිලධාරි වසමට අයත් ඩෙන්සිල් කොබ්බැකඩුව මාර්ගයේ පවතින බෝක්කුව ප්‍රදේශවාසීන් විසින් මීට වසර කිහිපයකට පෙර පුද්ගලික වියදමින් සකස් කර ගෙන ඇති අතර, මෙම පටු බෝක්කුවෙ හි ගමන් කළ හැක්කේ ත්‍රිරෝද රථ සහ මෝටර් බයිසිකල් පමණක් වීම නිසා නිවාස ඉදිකිරීම් සඳහා අමු ද්‍රව්‍ය ගෙන යාම වෙනුවෙන් හා වෙනත් අත්‍යාවශ්‍ය කාරණා වෙනුවෙන් මෙම බෝක්කුව යොදවා ගැනීමට නොහැකි වීම මත ප්‍රදේශවාසීන් දුෂ්කරතා හා ගැටළු රාශියකට මුහුණ පාමින් සිටින අතර ප්‍රවාහන කටයුතු සිදු කළ හැකි අයුරින් මෙය සකස් කර දීම සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට සනත් ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කරන ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

කාර්මික නිලධාරි මහතා යොදවා පරීක්ෂා කර බලා මේ සඳහා බෝක්කු බට 02 ක් ලබා දීමට හැකි බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කර සිටි අතර, එය ලබාදීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

### යෝජනා අංක 02

පොතුවිල් පාර ප්‍රගති මාවත ආරම්භ වන ස්ථානයේ ඇති අනවසර තාප්පක්ය නිසා එම මාර්ගය අවහිර වී ඇති අතර මේ වන විට මෙම තාප්පය අබලන් තත්ත්වයේ සහ අනතුරුදායක තත්ත්වයේ පසු වන නිසා සභාව මගින් එම තාප්පය ඉවත් කර මාර්ගය පුලුල් කර සකස් කර දීම සඳහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට සනත් ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කරන ලදී.

මේ දිනවල මෙම මාර්ගයේ සිදු කරනු ලබන සංවර්ධන කටයුතුවලදී මෙම අනවසර අනාරක්ෂිත ඉදිකිරිම නිසා මාර්ගයේ සංවර්ධන කටයුතු ද නතර වී ඇති අතර, කඩා වැටීමට ඉතා ආසන්නව පවතින මෙය ඉවත් කර දෙන ලෙස එම මාර්ගය භාවිතා කරන ප්‍රදේශවාසී ජනතාව 106 දෙනකු විසින් අත්සන් කරන ලද ඉල්ලීමක් ද ලබාදී ඇති බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමා නැවත ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මේ සම්බන්ධව කාර්මික නිලධාරි මහතා යොදවා පරීක්ෂා කර බලා අදාළ පරීක්ෂණ වාර්තාවන්ට අනුව මෙහි අවශ්‍ය කටයුතු සිදු කර දීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

➢ **හදිසි යෝජනාවක් ඉදිරිපත් කිරීම (රීති අංක 11 (8) )**

න්‍යායපත්‍රානුකූලව යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීමෙන් අනතුරුව අද දින සාකච්ඡා කර අනුමැතියක් ගත යුතු හදිසි යෝජනාවක් සම්බන්ධයෙන් මහ සභා අනුමැතිය ලබා ගත යුතු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කළ අතර ඒ සඳහා මහ සභාවේ විරුද්ධත්වයක්ද නොතිබුණු බැවින් ගරු සභාපතිතුමා විසින් එම හදිසි යෝජනාව පහතින් දක්වා ඇති ආකාරයට සභාගත කරන ලදි.

ප්‍රාදේශීය සභාවට අයත් WP PF 7419 අංක දරණ කැබ් රථයේ අත්‍යාවශ්‍ය අළුත්වැඩියා කටයුතු කිහිපයක් වෙනුවෙන් අදාළ කොටස් පරීක්ෂා කිරීමෙන් අනතුරුව දේශීය නියෝජිත ආයතනය විසින් රු.239,243.06 ක ඇස්තමේන්තුවක් අප වෙත ඉදිරිපත් කර ඇති අතර, මේ සඳහා ඌව පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ ලබා ගැනීමට අවශ්‍යව ඇති බැවින් මේ සඳහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කරන ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙවැනි අවස්ථාවකදී කටයුතු කරන ආකාරයට නිසි ක්‍රමවේදයන්ට යටත්ව මෙම කැබ් රථයේ අත්‍යාවශ්‍ය අදාළ අළුත්වැඩියා කටයුතු මෙම ඇස්තමේන්තු ප්‍රකාරව අදාළ නිර්දේශයන්ට යටත්ව සභා අරමුදල් යොදවා සිදු කර ගැනීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 06.<u>ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කිරීම.</u>

න්‍යායපත්‍රානුකූලව පසුගිය මාසයට අදාළව ඉදිරිපත් කර ඇති ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසට ගරු සභාපතිතුමා විසින් ගරු සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

පසුගිය මාසයේ එනම් 2021.02.01 දින සිට 2021.02.28 දින දක්වා වන ආදායම් වියදම් වාර්තාව පිළිගැනීම සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමා යෝජනා කරන ලද අතර, එම යෝජනාව ප්‍රදීප් විජේරත්න ගරු උප සභාපතිතුමා විසින් ස්ථිර කරන ලදී. සභාවේ විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුන බැවින් එම ආදායම් වියදම් වාර්තාව පිළි ගැනීම සුදුසු බවට ගරු සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 07. <u>කමිටු වාර්තා සලකා බැලීම</u>

**නැත**

## 08. <u>වෙනත් කරුණු ඉදිරිපත් කිරීම</u>

න්‍යායපත්‍රානුකූලව මීලඟට ඇත්තේ වෙනත් කරුණු ඉදිරිපත් කිරීම බැවින්,වෙනත් කරුණු සමඟම සභිකවරුන්ට අදහස් ප්‍රකාශ කිරීමට ඇත්නම් ඒ වෙනුවෙන් ගරු සභාවට අවසර ලබා දෙන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.

**ගරු සභාපතිතුමා**

එහිදී ප්‍රාදේශීය සභාවට අයත් නව තොග පොළ භූමියේ කඩ කාමර බදුගත් බදුකරුවන් විසින් කඩ කාමරවලට අදාළ ප්‍රධාන මුදල් ගෙවා අවසන් කර නොමැති බැවින්, 2020.06.12 වන දින පැවති මහ සභාවේදී ගනු ලැබූ තීරණයක් අනුව මෙම ප්‍රධාන මුදල් සහ හිඟ කුළී මුදල් ගෙවා අවසන් කිරීමට මෙම බදුකරුවන් හට ම මාස 10 ක සහන කාලයක් ලබාදුන් අතර, 2021 මාර්තු මස වන විට මෙම සහන කාලය ද අවසන් වී ඇති අතර, බදුකරුවන් 04 දෙනකු හැර අනෙක් සියළුම බදුකරුවන් තවදුරටත් මුදල් ගෙවීමට ඇති අතර, මේ සම්බන්ධවත්, ඒ වගේ ම 2021 වර්ෂයට අදාළව මොනරාගල නව බස් නැවතුම්පොළ කඩ කාමර 22 බදු දීම වෙනුවෙන් මේ වන විටත් ප්‍රධාන මුදල් ගෙවා අවසන් කර නොමැති බදුකරුවන් බහුතරයක් සිටින නිසා මේ සඳහා ද ඉදිරි කටයුතු කිරීම සම්බන්ධවත් මහ සභාවේ සාකච්ඡා කළ යුතු බවට ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.

**සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමා**

නව බස් නැවතුම්පොළ කඩ කාමර 22 බඳුගත් බදුකරුවන් හට ටෙන්ඩර් කොන්දේසි පනවා ඇති බැවින්, ඒ අනුව කටයුතු කළ යුතු බවත්, එසේ මුදල් නොගෙවන අය සිටී නම් එම දේපල අවලංගු කර නැවත ටෙන්ඩර් කළ යුතු බවටත් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටි අතර, ප්‍රදීප් විතානගේ ගරු මන්ත්‍රීතුමා ද එය එසේ සිදුවිය යුතු බවට තහවුරු කර සිටින ලදී.

**වයි.උපුල් ගරු මන්ත්‍රීතුමා**

ප්‍රදේශයේ අහිංසක ව්‍යාපාරිකයින් විසින් විශාල මුදල් යටතේ මෙම වෙළඳසැල් බදු ගැනීමට කටයුතු කර ඇති අතර, රටේ පවතින වසංගත තත්ත්වයත් සමග මේ වන විට ආර්ථිකමය වශයෙන් ව්‍යාපාරිකයින් මහත් අසීරුතාවයන්ට පත්ව සිටින නිසා මෙම මුදල් ගෙවා නිම කිරීම සඳහා මෙම වර්ෂය අවසන් වන තෙක් සහන කාලයක් ලබාදිය යුතු බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

**සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමා**

එසේ සහන කාලයක් ලබාදීම ටෙන්ඩර් කොන්දේසිවලට පටහැනි වන අතර, මෙය මුදල් ගෙවා නිම කළ අයට ද කරන්නාවූ මහත් අසාධාරණයක් ද වන බැවින්, සහන කාලයක් ලබාදීම සඳහා තමන් විරුද්ධ බව ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

**ප්‍රදීප් විතානගේ ගරු මන්ත්‍රීතුමා**

ටෙන්ඩර් පටිපාටියක් යටතේ වෙළඳ ව්‍යාපාරිකයින් හට කඩ කාමර බදු දීමේදී ඔවුන් විසින් අසාමාන්‍ය මුදල්වලට ටෙන්ඩර් ලබා ගැනීමෙන් අනතුරුව අදාළ මුදල් නැවත ගෙවීමට ප්‍රමාද කර සහන කාලයක් ඉල්ලා සිටීම වැරදි ක්‍රියාවලියක් බැවින් මේ සඳහා තමන් ඉතාමත් විරුද්ධ බවත්, ටෙන්ඩර් කොන්දේසිවලට යටත්ව නිවැරදි දේ ක්‍රියාත්මක විය යුතු බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

එසේ නම් මාස 03 ක වත් කෙටි සහන කාලයක් හෝ ලබා දෙන ලෙස නැවත වයි.උපුල් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

**පී.බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා**

නව බස් නැවතුම්පොළ කඩ කාමර සඳහා සභාව මගින් තක්සේරු කර තිබූ මිල ගණන්වලට වඩා ලක්ෂ ගණනින් ඉතා වැඩි මුදල්වලට මෙම ව්‍යාපාරිකයින් විසින් කඩ කාමර ලබා ගන්නා ලද්දේ එම මුදල් ගෙවීමට ඔවුන්ට හැකියාවක් පවතින බැවින් වන අතර, මෙම හේතුව නිසා ප්‍රදේශයේ සාමාන්‍ය ව්‍යාපාරිකයින්ට මෙම වෙළඳසැල් ලබා ගැනීමට අවස්ථාව නොලැබුණු බවත්, ඉතා වැඩි මුදල් යටතේ විවිධ අපේක්ෂාවන් මත විවිධ අය සමග එකතු වී සංවිධානාත්මකව මෙම ටෙන්ඩර් ලබා

ගැනීමට අදාළ පිරිස් විසින් කටයුතු කරන්නට ඇති බව ටෙන්ඩර් කමිටුවේ සිටි සාමාජිකයෙකු වශයෙන් එදින තමාට තේරුම් ගිය බවත්, මේ සඳහා සහන කාලයක් ලබාදීම වෙනුවෙන් තමන් ඉතාමත් විරුද්ධ වන බවත් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

<u>**අජිත් අගලකඩ ගරු මන්ත්‍රීතුමා**</u>

පී.බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා විසින් කරන ලද ප්‍රකාශය ඉතාමත් නිවැරදි බවත්, වෙනත් වෙනත් අවශ්‍යතාවයන් මත විශාල මුදල් යටතේ සංවිධානාත්මකව මෙම ටෙන්ඩර් ලබා ගැනීම සිදුවී ඇත්නම් නැවත වතාවක් මෙම දේපල ටෙන්ඩර් කිරීමක් සිදු වුවහොත් එම අවස්ථාවේදී ද මෙම දේම සිදු විය හැකි බැවින් මේ සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරන ලදී.

<u>**ප්‍රදීප් විජේරත්න  ගරු උප සභාපති**</u>

නව බස් නැවතුම්පළේ සහ නව තොග පොළේ කඩ කාමර බදු ගෙන ඇති අය තවදුරටත් ගෙවිය යුතු හිඟ මුදල් ගෙවීම සම්බන්ධව කතා කිරීමේදී කොරෝනා වෛරසය හේතුවෙන් මුළු රටම විශාල ගැටළුවකට මුහුණ පා සිටින අතර, ජනතාව ද මූල්‍යමය වශයෙන් විශාල අර්බුදයකට පත්ව සිටින මොහොතක මෙම ටෙන්ඩර් මුදල්  ගෙවීමට ඔවුන් එකඟ වී සිටියත් රටේ තත්ත්වය නිසා මේ වන විට අදාළ ටෙන්ඩර් මුදල් ගෙවා ගැනීමට නොහැකිව ඉතා අපහසුතාවයන්ට එම ජනතාව පත්ව සිටින බවට තමන්ටද තොරතුරු ලැබී ඇති බව ගරු උප සභාපතිතුමා ප්‍රකාශ කර සිටි අතර, මෙම තත්ත්වය සැලකිල්ලට ගනිමින් මෙම සියළු කඩ කාමරවල හිඟ මුදල් ගෙවීමට තවත් මාස 06 ක පමණ සහන කාලයක් ලබා දෙන ලෙස ගරු සභාවෙන් ඉල්ලා සිටින බවට  ප්‍රකාශ කර සිටින ලදී.

ගරු උප සභාපතිතුමා බොහෝම සාධාරණ ඉල්ලීමක් කර සිටි අතර, ප්‍රදේශයේ අහිංසක ජනතාව විසින් මෙම කඩ කාමර ලබා ගෙන ඇති නිසා අපේ ජනතාවට අපි ඇහුම්කන් දිය යුතු බැවින්, මෙම ඉල්ලීමට සාධාරණ තීරණයක් මේ ගරු සභාවෙන් ලබාදිය යුතු බවට වයි.උපුල් ගරු මන්ත්‍රීතුමා ද ප්‍රකාශ කර සිටින ලදී.

<u>**ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම**</u>

මෙවැනි තත්ත්වයන් මත බදුකරුවන්ගේ ඉල්ලීම්වලට අනුව කඩ කුළී ගෙවීම සම්බන්ධව යම් යම් සහන අදාළ අවස්ථාවන්වලදී ලබා දුන්නත් කඩ කාමරවල ප්‍රධාන මුදල් (key money) අනිවාර්යයෙන් ම ගෙවිය යුතු වන අතර, මෙය විගණනයට ලක්වන කාරණාවක් බැවින්, මේ සඳහා තවදුරටත් සහන කාලයක් ලබාදිය නොහැකි බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

නව වෙළඳ සංකීර්ණයේ අළුතින් ඉදිකරන ලද කඩ කාමර 16 ටෙන්ඩර් කරනවා ද යන්න වයි.උපුල් ගරු මන්ත්‍රීතුමා විමසා සිටින ලදී.

මෙම කඩ කාමර 16 අළුතින් ඉදිකිරීමේදී එම ස්ථානයේ කළින් සිටි ඉවත් කරන ලද වෙළඳුන් 16 දෙනකු සිටින බැවින්,  මේ සම්බන්ධව උපදෙස් පතා කොමසාරිස්තුමන් වෙත සභාව මගින් දන්වා යැවීමෙන් අනතුරුව පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය හරහා ඒ සම්බන්ධව චක්‍රලේඛයක් එවා ඇති අතර මෙම කඩ කාමර 16 පැරණි වෙළඳුන් 16 දෙනා හට ම ලබාදිය යුතු බවට එයින් තහවුරු වන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

මෙම කඩ කාමර 16 ටෙන්ඩර් කිරීම සඳහා මීට පෙර සභා තීරණයක් අරගෙන තිබෙන නිසා මේ සඳහා චක්‍රලේඛ අවශ්‍ය නොමැති බව වයි.උපුල් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරන ලදී.

ඉන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් මහ සභාව කාරක සභාවක් බවට පත් කර එම චක්‍රලේඛනය සභාවට ඇසෙන ලෙස කියවීමට සභා ලේකම්ට අවස්ථාව සලසා දෙන ලදී.  ලේකම්තුමා විසින් අදාළ

චක්‍රලේඛනය සභාව වෙත සම්පූර්ණයෙන් ම කියවා අවසන් වීමෙන් පසුව ගරු සභාපතිතුමා විසින් කාරක සභාව නැවත මහ සභාව බවට පත් කරන ලද අතර, මේ සම්බන්ධව සභාවේ තීරණය කුමක් ද යන්න සභාවෙන් විමසා සිටින ලදී.

එහිදී මෙහි පැහැදිලි නොමැති තැන් බොහෝමයක් ඇති නිසා මෙය ගැටළුකාරි සහිත ලියවිල්ලක් බවත්, මෙම දේපල මගින් සභාවට විශාල මුදලක් අය කර ගැනීමට හැකි අවස්ථාවක් වශයෙන් නව වෙළඳ සංකීර්ණයේ අළුතින් සකස් කර ඇති කඩ කාමර 16 ටෙන්ඩර් කර ලබාදීම සුදුසු බැවින්, ඒ සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවත් වයි.උපුල් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටි අතර, එසේම වර්ෂ ගණනාවක් තිස්සේ නඩු කියා නිරවුල් කරගත් සභාව සතු පොතුවිල් පාරේ පිහිටි පර්චස් 3 බිම් කොටසේ වැසිකිළියක් හැදීමට මීට පෙර සභා වාරයකදී යෝජනා කර ගත්තත් අද වන තුරු ඒ සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන එහි තක්සේරු මුදලවත් සභාවට අය කර ගැනීමට කටයුතු නොකිරිම නිසා මේ දේවල් සම්බන්ධව තමන්ට විශ්වාසයක් තැබිය නොහැකි බව වයි.උපුල් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරන ලදී.

සභාව සෝෂාකාරී විය පැහැදිලි නැත

<u>චාමර නානායක්කාර ගරු මන්ත්‍රී</u>

ප්‍රාදේශිය සභාවක් වශයෙන් සභාවේ උන්නතිය වෙනුවෙන් ආදායම් තත්ත්වය ඉහළ නංවා ගැනීමට නිරතුරුවම අප කටයුතු කළ යුතු බැවින්, ඒ සඳහා සභාව හරහා අපට ඕනෑම තීරණයක් ගත හැකි බැවින්, උපුල් මන්ත්‍රීතුමා ගෙන එන ලද යෝජනාවට තමන් එකඟත්වය ලබා දෙන බව ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටි අතර, ගරු සභාවේ මේ සම්බන්ධව සාකච්ඡා කර වගකීමෙන් යුතුව නිවැරදි තීරණයක් ගන්නා ලෙසද ප්‍රකාශ කර සිටින ලදී.

<u>සුනිල් අරංගල ගරු මන්ත්‍රී</u>

කොමසාරිස්තුමන් විසින් එවා ඇති චක්‍රලේඛ සම්බන්ධව විශ්වාසයක් නොමැති ගැටළුකාරී බව කවුරු හෝ කියනවා නම් මේ සඳහා සභාව ගන්නා තීරණය කුමක් ද යන්නත්, නෛතික ක්‍රමවේදයන්ට යටත්ව මෙම කඩ කාමර 16 එහි සිටි අයට ම ලබා දීමට කටයුතු කළ යුතු බවත්, ඒවගේ ම පොතුවිල් පාර සභාව සතු පර්චස් 3 බිම් කොටසේ වැසිකිළියක් ඉදිකිරිම අත්‍යාවශ්‍ය නොවන බැවින්, එම පරිසරයට හා සභාවට ගැළපෙන වෙනත් ඉදිකිරිමක් සිදු කිරිම සුදුසු බවටත් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>

සභාව සතු පොතුවිල් පාර පිහිටි පර්චස් 3 ක භූමි ප්‍රමාණය කිසිම ගැටළුවකින් තොරව තවමත් නිරවුල්ව පවතින බැවින් මෙහි වැසිකිළියක් ඉදිකිරිම කාලෝචිත නොවන බැවින්, වෙනත් ඉදිකිරිමක් කිරිම සඳහා මහ සභාවේ යෝජනා ස්ථිර කර ගන්නා ලෙස ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

එහිදී මෙම සම්පූර්ණ භූමි ප්‍රමාණය තක්සේරු කර රජයේ දේපලක් වශයෙන් බදු පදනම මත වාර්ෂිකව ලබාදීම සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

<u>අජිත් අගලකඩ ගරු මන්ත්‍රීතුමා</u>

කොමසාරිස්තුමන් විසින් එවා ඇති චක්‍රලේඛයට අනුව නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 16 ටෙන්ඩර් කිරිම සුදුසු වන අතර, එහි සිටි පැරණි වෙළඳුන් ඉල්ලීම් කර තිබුණොත් එම ඉල්ලීම්වලට අනුව ඔවුන්ට කඩ කාමර ලබාදීමේදී වැඩිම ලංසු මුදලින් 20%ක් අඩුකර ලබා දිය යුතු අතර, වෙනත් ඉල්ලුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් ලංසු මුදල් අඩු නොකර ඒ අය සඳහා ලබා දිය යුතු බවට එහි

සඳහන් වන අතර, මෙහි විනිවිද භාවයක් ඇති අතර, සභාවට ආදායමක් ද ලබා ගත හැකි බව ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරන ලදී.

<u>අතුල කුමාරසිරි ගරු මන්ත්‍රීතුමා</u>

මෙසේ ගැටළුකාරී තත්ත්වයන් ඇති කර ගනිමින් නිවැරදි තීරණයක් ගැනීමට නොහැකි බැවින්, කොමසාරිස්තුමන් විසින් එවා ඇති චක්‍රලේඛයට අනුව කටයුතු කිරීම සුදුසු බවත්, අජිත් මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ ආකාරයට මෙම කඩ කාමර 16 ටෙන්ඩර් කිරීමත්, පැරණි 16 දෙනා ඉල්ලීම් කළොත් ඒ අයට ප්‍රමුඛත්වයක් ලබාදීම සුදුසු බවත් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ අතර, මෙහි නිවැරදි තීරණයක් ගැනීමට ලබන සභා වාරයේදී මෙම පැරණි වෙළඳුන් 16 දෙනා පිළිබඳවත් කොමසාරිස් කාර්යාලයට උපදෙස් පතා සභාව මගින් යවන ලද ලිපියේ පිටපත් ද සහ කොමසාරිස්තුමන් විසින් එවන ලද චක්‍රලේඛයේ පිටපත් ද සෑම සභිකවරයෙකුටම ලබා දෙන ලෙසත් ඉන් අනතුරුව මේ සඳහා නීත්‍යානුකූලව නිවැරදි තීරණ ගනිමු බවටත් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටි අතර, එසේ කටයුතු කිරීම සුදුසු බවට සභාවේ බහුතරයක් දෙනා එකඟතාවය ද පළ කර සිටින ලදී.

ඉන් අනතුරුව මේ සම්බන්ධව නැවත කතා බහට ලක් වුවත් සභාව දැඩි ලෙස ඝෝෂාකාරී වීම හේතුවෙන් ප්‍රකාශයට පත් කරන ලද අදහස් පැහැදිලි නොවීය.

<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>

ඉන් අනතුරුව බදු ගෙන ඇති සියළුම කඩ කාමරවලට අදාළ සියළුම හිඟ මුදල් ඇතුළු ප්‍රධාන මුදල් ගෙවීම සඳහාත්, කොරෝනා වසංගතයේ මුල් අවස්ථාවේදී ජනතාවට සහන සැලසීම වෙනුවෙන් සභාවෙන් ලබාගත් අත්තිකාරම් නොපියවන ලද මන්ත්‍රීවරුන් හට ද තවදුරටත් සහන කාලයක් ලබාදීමට නොහැකි අතර, මෙම මස අවසන් වීමට පෙර මෙම සියළුම හිඟ මුදල් සහ අත්තිකාරම් ගෙවීමට හා අනෙකුත් සියළුම හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කරන බවත්, එසේ මුදල් නොගෙවන අය සම්බන්ධව ඉදිරි කටයුතු කිරීම සඳහා උපදෙස් ලබා ගැනීමට කොමසාරිස්තුමන් වෙත උපදෙස් පතා ලිඛිතව දන්වා යවන බවට ගරු සභාපතිතුමා සභාව වෙත දන්වා සිටින ලදී.

## 8.2 <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - රමණී රත්නායක මැතිතුමිය</u>

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව රටේ පවතින කොරෝනා ව්‍යසනයට අනුව මොනරාගල බල ප්‍රදේශය තුළ මෙම රෝගය බෝවීම පාලනය කර ගැනීමට උපරිම කැපවීම් කරනු ලබන ගරු සභාපතිතුමා ඇතුළු මොනරාගල ප්‍රාදේශීය සභාවේ සියළු දෙනාටත්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමා, මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන් ඇතුළුව සිරිගල රෝහලේ සියළුම කාර්ය මණ්ඩලයටත් බෙහෙවින්ම ස්තුතිය පුදකර සිටින බවට ගරු මන්ත්‍රීතුමිය ප්‍රකාශ කර සිටින ලදී.

II. ඒ වගේ ම පසුගිය දිනක ලෝක කාන්තා දිනය සමරනු ලැබූ අතර, රටේ සියළුම කාන්තාවන්ට තමන් සුභ පතන බවත් ඒවගේ ම මාධ්‍ය ජාලාවල නිරතුරුව රටේ කාන්තාවන්ට සිදුවන අපරාධ හා ජීවිත හානි සම්බන්ධ තොරතුරු ලැබෙන අතර, ඒ සම්බන්ධව ඉතා කනගාටුව ප්‍රකාශ කර සිටින බවත්, ගරු මන්ත්‍රීතුමිය ප්‍රකාශ කර සිටින ලදී.

III. ඒ වගේ ම දේශපාලන රුස්වීම්වල අපේම කාන්තාවන් විසින් සියළුම කාන්තාවන්ගේ සනීපාරක්ෂක අවශ්‍යතාවයන් ලබා ගැනීම වෙනුවෙන් හඬවල් නැංවූ බවත්, එහි ප්‍රතිඵලයක් වශයෙන් පසුගිය කාන්තා දිනයේදී කාන්තා කටයුතු ගරු ඇමතිතුමා ඊට සමාගමත් සමග එකතු වී රටේ සමස්ථ ගැහැණු දරුවන් වෙනුවෙන් ඔවුන්ට අවශ්‍ය සනීපාරක්ෂක සෞඛ්‍ය

උපකරණ නොමිලේ ලබාදීම වෙනුවෙන් එය ඇගයීමට මේ මොහොතේ අවස්ථාවක් කර ගන්නා බවට ගරු මන්ත්‍රීතුමිය ප්‍රකාශ කර සිටින ලදී.

IV. තව ද හුලංදාව හංදියේ මාර්ගය මේ දිනවල සංවර්ධන කටයුතු කර ගෙන යන අතර, මාර්ගයේ මැද කොටසක මැටල් අතුරා තිබීම මත බයිසිකල් ලිස්සා යාමේ ඉතා අවධානමක් පවතින බවට දැක ගැනීමට තිබෙන නිසා ඒ සම්බන්ධව අවධානය යොමු කරන්න කියාත් ඒ වගේ ම නගරයේ ප්‍රධාන මාර්ගවල නිකරුනේ හැසිරෙන ගවයින්ගේ වැඩිවීමක් දක්නට ඇති අතර, අනතුරු සිදුවීමට පෙර අපේ යුතුකම අපි ඉෂ්ඨ කළ යුතු බැවින් මේ සඳහා අවධානය යොමු කරන්න කියා ගරු මන්ත්‍රීතුමිය ප්‍රකාශ කරමින් සියළු දෙනාටම ස්තුතිය පුදකර සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>

- ගරු මන්ත්‍රීතුමිය විසින් ඇගයිය යුතු කාරණාවක් වෙනුවෙන් ස්තුතිය පුද කර සිටීම සම්බන්ධව සතුට ප්‍රකාශ කර සිටින බවටත්, අනෙකුත් කාරණාවන් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

## 8.3 <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ක්‍රිශාන්ත රත්නායක මැතිතුමා</u>

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව මහ නගර සභාවක් ස්ථාපනය කිරිමට අවශ්‍ය සියළුම සුදුසුකම් පවතින ප්‍රදේශයක් ලෙස මොනරාගල නගරය හඳුනා ගෙන ඇති බවත්, මේ වන විට සැලසුම්වලට පමණක් සීමා වෙමින් පවතින මහ නගර සභාවක් බවට පත් කිරිමේ කාරණාව සම්බන්ධව නිශ්චිත තීරණයක් ලබන මැතිවරණයට පෙර කෙසේ හෝ ලබා ගෙන එය ඉටු කර ගැනීමට කටයුතු කළ යුතු බැවින්, වග කිව යුතු සියළුම පාර්ශවයන් සඳහා මෙය ගැසට් කර ගැනීමට අවශ්‍ය මූලික පියවර ඉතා කඩිනමින් දියත් කිරිමට කටයුතු කළ යුතු බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටි අතර, එය ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ව්‍යාපාරික ප්‍රජාව වෙනුවෙන් නගරයේ ජනතාව වෙනුවෙන් කරන්නාවූ මහඟු මෙහෙවරක් බව ද ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

II. ඒ වගේ ම මොනරාගල මහ රෝහලේ ගැටළු සම්බන්ධවත් එයින් ප්‍රදේශයේ අහිංසක ජනතාවට පත්වන ඉරණම සම්බන්ධයෙනුත් පසුගිය කාලය පුරාවටම සාකච්ඡා කළත්, තවමත් විසඳුම් ලැබී නොමැති අතර, නිසි සුදුසුකම්වත් සපුරා නොමැතිව අවුරුදු 14 ක් පුරාවට ම රෝහලේ සිටින වැඩ ආවරණය කරන අධිකාරිවරයාගේ පරිපාලනයේ දුර්වලතාවය කොතෙක් ද යන්න රෝහලේ සියළුම කාර්ය මණ්ඩලය දන්නා බවත්, උද්ඝෝෂණය කරන තැනට ම මේ වන විට පත්වී ඇති බවත්, දරුවන් බිහි කිරිමට මෙම රෝහලට යන මව්වරුන් නැවත එළියට පැමිණෙන්නේ නැවත දරුවන් හදන්නේ නැත යන තීරණය මත බවත්, මෙම මව්වරුන්ටත් කුඩා දරුවන්ටත් පහසුකමක්වත් මානසික සහනයක්වත් නොදෙන මෙම වාට්ටු සංකීර්ණයේ සහ සමස්ථ රෝහලේ ක්‍රියාකාරිත්වය ඉතාමත් අවසනාවන්ත තත්ත්වයකට පත්වෙමින් පවතින බවත්, ඒ වගේ ම පිටරටවල් වල ගොස් මුදලට විභාග සමත්වී ලංකාවට පැමිණ ලියාපදිංචි වී සිටින වෛද්‍යවරුන්ගේ සහ විශ්ව විද්‍යාලවලින් එළියට එන නවක වෛද්‍යවරුන්ගේ පුහුණු මධ්‍යස්ථානය බවට පත්ව ඇති දිස්ත්‍රික් මහ රෝහල සම්බන්ධ මෙහි පරිපාලනයේ පවතින දැඩි දුර්වලතාවය සම්බන්ධව රටේ ඉහළම දේශපාලන අධිකාරිය වෙත දන්වා යැවිය යුතු බවත් අපේ මේ සම්පත රැක ගත යුතු බැවින්, ඉතාමත් ගුණාත්මක සෞඛ්‍යාරක්ෂිත රෝහලක් විය යුතු අතර, ප්‍රදේශයේ ජනතාවට විශ්වාසයෙන් කටයුතු කළ හැකි ස්ථානයක් බවට පත් කරවා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස දන්වා යැවිය යුතු බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

III. ඒ වගේ ම මොනරාගල බල ප්‍රදේශයට පිටින් පැමිණෙන අය ඉතා විශාල වශයෙන් අනවසර ඉඩම් ලබා ගෙන ඔවුන්ට අයිති කර ගැනීමේ මාපියාවක් දියත් වෙමින් පවතින අතර, තව නොබෝ දිනකින් ප්‍රදේශයේ ජනතාවට ඉදිරි පරම්පරාවට ප්‍ර දේශය තුළ ඉඩමක් මිලදී ගැනීමට අවශ්‍ය පහසුකම් නැති වෙමින් පවතින අතර, මේ පිළිබඳව දැඩි අවධානය යොමු කර සුදුසු පියවරක් ගත යුතු බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරන ලදී.

IV. ඒ වගේ ම නව බස් නැවතුම්පොළ සහ තොග පොළේ කඩ කාමර බඳුගත් බදුකරුවන් හට මුදල් ගෙවීමේ කාලය සඳහා සහන කාලයක් ලබාදීම සුදුසු බවට ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රීතුමා සියළු දෙනාටම ස්තුතිය පුදකර සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>

- ප්‍රාදේශිය සභාව නගර සභාවක් බවට පත් කිරිමට අවශ්‍ය සියළු සැලසුම් මේ වන විට අවසන් කරමින් පවතින අතර, ගැසට් කිරිමේ කටයුත්ත ද ඉතා කඩිනමින් සිදු වෙයි බවත්, ඊළඟ මැතිවරණය වන විට අනිවාර්යයෙන්ම මෙය නගර සභාවක් වන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදි.
- ඒ වගේ ම නක්කල හංදියේ මාළු වෙළඳසැල් සම්බන්ධයෙන් ගත් විට ප්‍රධාන මාර්ගයේ සිට අඩි 50 ක් ඉඩ තබා යම්කිසි ඉඩමක වෙළදාම් කටයුත්තක් සිදු කරනවා නම් එවැනි වෙළදාම් වෙනුවෙන් අපට කළ හැක්කේ වාර්ෂික බලපත්‍රයක් ලබාදීම පමණක් වන අතර, එසේ වෙළදාම් සිදු කරන වෙළඳුන් අනිවාර්යයෙන් ම ප්‍රාදේශිය සභාවේ වාර්ෂික වෙළඳ බලපත්‍ර ලබා ගත යුතු අතර, ඒ අයගෙන් දෛනික කුළී අය කර ගැනීමට නොහැකි බව ද ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටි අතර, රෝහලේ පවතින මෙම ගැටළුව අවුරුදු ගාණක් පත්තරවල ප්‍රචාරය වුවත් වැඩක් නොමැති නිසා ඉදිරියේදී පැවැත්වීමට නියමිත ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට රෝහල් අධිකාරිතුමන්ට කැඳවීමට කටයුතු කර මෙම ගැටළු සම්බන්ධව සාකච්ඡා කරමු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

## 8.4 <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සනත් ගුණවර්ධන මැතිතුමා</u>

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව සභාව පටන් ගත්දා සිට මේ දක්වා සිරිගල රෝහලේ අඩුපාඩු ගැටළු සම්බන්ධව සාකච්ඡා කරන නමුත් පසුගිය දිනක පැවති ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී ප්‍රදේශයේ සියළුම ඉහළ දේශපාලන අධිකාරිය මෙන් ම වග කිවයුතු සියළුම පිරිස් පැමිණි සිටි අතර, එහි ප්‍රථමයෙන්ම සිරිගල රෝහගේ ප්‍රශ්න සම්බන්ධව සාකච්ඡා කිරිමට අවස්ථාව ලබාදී තිබූ අවස්ථාවේදී මේ කියන කිසිම කෙනකු එම අවස්ථාවේදී ඔවුන්ගෙන් කිසිදු ප්‍රශ්න විමසීමක් සිදු නොකර සියළු දෙනා ම නිශ්ශබ්දව සිටි අතර, එහිදී සිරිගල රෝහලේ කිසිම ගැටළුවක් නොමැති බව සියළු දෙනා ම අවබෝධ කර ගත් අතර, මේ ගැටළු සියල්ල කතා කළ යුතු තැන සියළු දෙනා ම නිශ්ශබ්දව සිටීම සම්බන්ධව තමන් ඉතාමත් කනගාටුවට පත් වන බව ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ අතර, ඉතාමත් නින්දිත ක්‍රියාවලියක් පවතින සිරිගල මහ රෝහලේ මේ වන විට වුවත් සැත්කමක් සඳහා පවා රෝහල්ගත වන රෝගීන් නැවත රෝහලින් පිටවෙන්න වෙයි ද යන බියෙන් සැකෙන් පසුවන අතර, ප්‍රදේශයේ ඉහළ බළධාරින් නිලධාරින් හා ඔවුන්ගේ පවුලේ උදවියට මේවා ප්‍රශ්න නොවන අතර, ප්‍රදේශයේ අහිංසක ජනතාව මෙම ගැටළුවලට නිරතුරුව මුහුණ දීමට සිදුවන බැවින්, අවශ්‍ය ස්ථානවල මේවා සාකච්ඡා කර විසඳුම් ලබා ගැනීම වගකිව යුතු සියළු දෙනාගේ ම යුතුකම හා වගකීම වන අතර, ප්‍ර දේශයේ අහිංසක ජනතාවගේ දැවෙන

ප්‍රශ්න සම්බන්ධව මෙවැනි කමිටුවලදී වගකිවයුතු කිසිම පාර්ශවයක් විසින් කතා නොකර නිශ්ශබ්දව සිටිම ඉතාමත් කනගාටුදායක බැවින්, මීට පසු එසේ නොකර මෙවැනි අත්‍යාවශ්‍ය ගැටළු සම්බන්ධව අවස්ථාව ලැබෙන සෑම ස්ථානයකම හඬක් නඟා ප්‍ර දේශයේ අහිංසක ජනතාවට සාධාරණය ඉටු කරන්න සියළු දෙනා ම වග බලා ගත යුතු බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

II. ඒ වගේ ම නව බස් නැවතුම්පොලේත්, නව පොළ භූමියේත් කඩ කාමර සම්බන්ධව කතා කිරිමේදී මෙම කඩ කාමර සඳහා ගෙවිය යුතු සියළුම හිඟ මුදල් ගෙවා නිම කිරිමට දීර්ඝ සහන කාලයක් ලබා නොදී ඉතා කෙටි කලකින් මෙම මුදල් අය කර ගැනීම සිදු කළ යුතු බවත්, ඒ වගේ ම කඩ කාමර සම්බන්ධව කොමසාරිස්තුමන් එවා ඇති චක්‍ර ලේඛය කියවා බැලීමට සියළුම මන්ත්‍රීවරුන් හට පිටපතක් හෝ ලැබීමට සලස්වන ලෙසත් ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රීතුමා සියළු දෙනාටම ස්තුතිය පුද කර සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>

- සනත් මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ කාරනාවන් නිවැරදි බවත්, ප්‍රදේශයේ ගැටළු මෙන්ම විශේෂයෙන්ම සිරිගල රෝහලේ පවතින ගැටළු සම්බන්ධව මේ සභාවේ සාකච්ඡා කළාට වැඩක් නොමැති අතර, ප්‍රාදේශීය සම්බන්ධිකරණ කමිටුවට රෝහල් අධිකාරි කැඳවා මේ ප්‍රශ්න සම්බන්ධව සාකච්ඡා කරමු බවට  ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

## 8.5 <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අතුල කුමාරසිරි මැතිතුමා</u>

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව ප්‍රාදේශීය සම්බන්ධිකරණ කමිටුවට ආරාධනා ලැබුණත් නැතත් සහභාගී වීම අප සෑම දෙනාගේ ම වගකීමක් බවත්, තමන්ට ද ඒ සඳහා ආරාධනා කර ශෂින්ද්‍ර රාජපක්ෂ අමාත්‍යතුමාගේ කාර්යාලයෙන් ලිපියක් එවා තිබූ බැවින්,ඒ සම්බන්ධව ස්තුතිය පුද කර සිටින බවත්, ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටි අතර, ඒ වගේ ම පසුගිය දිනවල පැවති ප්‍රාදේශීය සම්බන්ධිකරණ කමිටුවේදී කිසිම දෙයක් සම්බන්ධව රෝහල් අධ්‍යක්ෂවරයාගෙන් විමසා නොසිටිය බවට චෝදනා කිරිම වැරදි බවත්, රෝහලේ X Ray යන්ත්‍රය එළියට දමා තිබීම සම්බන්ධව පත්තරේ තිබුණ කාරණාවක් සම්බන්ධයෙන් තමන් එහිදී විමසා සිටිය බවත්. මහජන නියෝජිතයින් වශයෙන් ඕනෑම තැනක සියළු ජනතාවගේ ප්‍රශ්නවලදී හඬ නගන බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

II. ඒ වගේ ම කොරෝනා රෝගය නිසා මේ වන විට රට තුළ දැවැන්ත ප්‍රශ්න රාශියක් ගොඩ නැගෙමින් පවතින මොහොතක් බැවින්, විශේෂයෙන් ප්‍රදේශයේ රාජ්‍ය ආයතනවලින් සේවය ලබා ගැනීමට පැමිනෙන මහජනතාව ආයතනවල පවත්වා ගෙන යනු ලබන සෞඛ්‍යාරක්ෂිත වැඩපිළිවෙල යටතේ ඉතාමත් අපහසුතාවයන්ට පත්ව ඇති අතර, තමන්ගේ සේවය කර ගන්නා තුරු ආයතනය ඇතුළට නොගෙන එළියේ සිටගෙන සිටීමෙන් බොහෝ වේලාවක් එසේ සිටිය ද අන්තිමේදී අදාළ නිලධාරි මහතා නොමැති බැවින් නැවත යාමට සිදුවීම නිසා බොහෝ ජනතා මැසිවිලි නිරතුරුවම ඇසෙන බැවින්,  රජයේ පාලන බලතල ප්‍රකාරව මේ සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කර මේ ආයතනවලට සේවය ලබා ගැනීමට පැමිණෙන සෑම කෙනකු සඳහා ම සාධාරණ හා කාර්යක්ෂම සේවයක් ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

III. ඒ වගේ ම සමූපකාර ව්‍යාපාරය ගැන කතා කිරිමේදී අද වන විට සමූපකාර සමිති අඩපන වෙලා මෙම ව්‍යාපාරය කඩා වැටීමට ලක් වෙමින් පවතින බව පසුගිය දිනෙක පුවත්පතක ද

සවිස්තරාත්මක විස්තරයක් ද යොදා තිබූ අතර, රටේ දියුණුවත් සමග මෙම සේවා වැසී යාමට ඉඩ නොදී රටට වටිනා සම්පතක් බදු සමූපකාර ව්‍යාපාරය ශක්තිමත් කර නඟා සිටිවීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් දියත් කිරිමට අවධානය යොමු කළ යුතු බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

IV. එලෙස ම රටේ පවතින වසංගත තත්ත්වයත් සමග ජනතාව බොහෝ සෙයින් ආර්ථික වශයෙන් අර්බුද රාශියකට පත්ව ඇති මොහොතක නව ආණ්ඩුව යටතේ ද විශාල සහන මේ වන විට ලබාදී තිබුණත්යම් යම් අවස්ථාවලදී මිනිසුන්ට අසාධාරණකම් සිදුවන අවස්ථා ඇතිවන බවත්, ඊට නිදසුනක් වශයෙන් යම් පුද්ගලයෙකුගේ විදුලි බිල ලැබී දින හතකින් ගෙවා නිම කළ යුතු බවට දැනුම් දී නැවත දින හතක් ගත වීමටත් පෙර නැවත එම බිලට ම තවත් මුදලක් එකතු කර කිසිම අවස්ථාවක් නොදී විදුලිය විසන්ධි කර තිබූ අවස්ථා ඇති අතර, මෙවැනි පහළ මට්ටමේ සේවකයින් විසින් දුර්වල අවස්ථා ඇති කරවන බව ද ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

V. ගරු අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පසුගිය දිනෙක මදුරුකැටිය ඇඟළුම් කර්මාන්ත ශාලාව විවෘත කිරිම මත ප්‍රදේශයේ කාන්තාවන් 500 කට පමණ රැකියා අවස්ථා ලැබී ඇති බවත් ඒ සම්බන්ධව හෘදයාංගම ස්තූතිය පුද කර සිටින බවත්, ඒ වගේ ම බල ප්‍රදේශයේ මාර්ග දෙපස බොහෝ ස්ථානවල ප්‍රමිතියකින් තොර මිදි ඇපල් වැනි පළතුරු වර්ග විකුණන අතර, ඒවායේ කිසිම නැවුම් බවක් නොමැති බව තමන්ට අත්දැකීමෙන් ම තහවුරු කර ගැනීමට හැකිවූ අතර, මේ සම්බන්ධව වහාම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට දැනුම් දී අවශ්‍ය කටයුතු සිදු කරන්න කියාදඅනුම් දිය යුතු බවත්, ඒ වගේ ම ප්‍රදේශයේ මාර්ග දෙපස මාළු වෙළඳාම් කරන බොහෝ දෙනකුගේ තරාදිවල වෙළඳුන් ගේ වාසිය තකා යම් යම් වෙනස්කම් සිදු කර ගෙන යන බව තමාත් අත්දැකීමෙන් ම ප්‍රකාශ කරන බැවින්, ඒ සම්බන්ධව අවධානය යොමු කරන්න කියාත් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

VI. ඒ වගේ ම කුඹුක්කන හංදිය මේ වන විට විශාල ජනතාවක් ගැවසෙන පාසල් ළමුන් ගැවසෙන ජනාකීර්ණ ස්ථානයක් බැවින්, මෙහි ඇති පොලිස් මුරපොළේ රාජකාරි කටයුතු වෙනුවෙන් ඉතා සීමිත නිලධාරින් පිරිසක් යොදවා තිබීම එම ප්‍රදේශයේ රාජකාරි කටයුතු සියල්ල කිරිමට අපහසු බැවින්, මේ සම්බන්ධව පොලිස් අධිකාරි හට දැනුම් දී අවශ්‍ය කටයුතු සිදු කරන්න කියා අතුල මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටි අතර, සිරිගල 4 වන පටුමගේ අවසන් කොටස ගමන් කිරිමටවත් නොහැකි මට්ටමේ පවතින බවට ප්‍රදේශවාසීන් විසින් දන්වා ඇති බැවින්, ඒ සඳහා ද අවධානය යොමු කරන්න කියාත් සභාවක් විදිහට ගනු ලබන සියළුම නිවැරදි තීන්දු තීරණවලට තම පක්ෂයේ සියළුම දෙනාගේ උපරිම සහයෝගය ලබා දෙන බව ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රීතුමා සියළු දෙනාටම ස්තූතිය පුදකර සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>

- කොරෝනා රෝගය නිසා ආයතනවලට සේවය සඳහා පැමිණෙන මහජනතාව පත්වන අපහසුතාවය සම්බන්ධව දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුවේදී සාකච්ඡා කරමු බවත්, ඒ වගේ ම ප්‍රදේශයේ විදුලිය නොමැතිව සිටින පවුල් 600 කට පමණ සිංහල අවුරුදු සමයට පෙර විදුලිය නොමිලේ ලබා දීමට නව ආණ්ඩුව යටතේ කටයුතු යොදවා ඇති බවත්, ඒ වගේ ම සමූපකාර ව්‍යාපාරය යම් පසු බෑමකට ලක්ව පවතිනවා නම් අදාළ විගණකාධිවරුන්, කොමසාරිස්වරුන් සිටින නිසා ඔවුන් උනන්දුවෙන් හා වගකීමෙන් මේ සම්බන්ධව සොයා බැලිය යුතු අතර, ප්‍රදේශයේ මහජනතාවට බලපාන බොහෝ ගැටළු ප්‍රමාණයක් ඉදිරිපත් කර සිටීම සම්බන්ධව

අතුල මන්ත්‍රීතුමන්ට ස්තුතිවන්ත විය යුතු බවත් අනෙකුත් කාරණා සියල්ල විසඳා ගැනීමට අදාළ ආයතන වෙත දැනුම් දීමක් කරන බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

## 8.6 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එම්.ගුණවර්ධන මැතිතුමා

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව සභාව මගින් බදු දී ඇති කඩ කාමර සඳහා අදාළ බදු කුළී ගෙවීමේදී විශ්‍රාමික රාජ්‍ය සේවකයෙකු වශයෙන් රජයෙන් ලබා දී ඇති චක්‍ර ලේඛ, නීති, අණපනත් පවතින්නේ නම් ඒ අනුව කටයුතු කිරිම වඩාත් නිවැරදි වන අතර, එසේ නොකර මත භේද ගැටුම් ඇති කර ගැනීම අපට හොඳ නැති බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

II. ඒ වගේ ම කොරෝනා වසංගත මුල් අවධියේ දී ජනතාවට සහන සැපයීම වෙනුවෙන් මන්ත්‍රීවරුන් විසින් ලබා ගත් අත්තිකාරම් පියවීම සඳහා තවත් ඉදිරියට සහන කාලයක් ලබාදීම සුදුසු බවට ද ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටි අතර, ගරු සභාපතිතුමන්ගේ අනුග්‍රහය යටතේ බෝහිටිය ප්‍රදේශයේ ජනතාවගේ ඉල්ලීම්වලට ඇහුම්කන් දී බෝහිටිය පාසල දක්වා ජල නළ දීර්ඝ කර ගැනීමට සභාව මගින් අවශ්‍ය කටයුතු සිදු කර දුන් අතර, නැවත එහි අතුරු මාර්ගවල ස්ථාන කිහිපයක ජල නළ එළිමට කාණු සකස් කර ගැනීමට අවශ්‍ය බැවින්, ඒ වෙනුවෙන් දින දෙකකට පමණ එක්ස්කැවේටර් යන්ත්‍රය ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා ඉල්ලා සිටින ලදී. ඒ වගේ ම අළුත්වත්ත පදිංචි ජී.එම්.කරුනාරත්න මහතා විසින් සභාවට යොමු කර තිබූ ජල නළ පද්ධතිය දීර්ඝ කර දීම සම්බන්ධවත් ඒ වගේ ම කිවුලේආර ජල යෝජනා ව්‍යාපෘතිය අළුත්වත්තට පැමිණෙන විට විශාල කාලයක් ගත වන බැවින්, මීටර් 500 ක පමණ ප්‍රමාණයකට කාණු කපා දීමට කටයුතු කළොත් එම ජල මාර්ගය අළුත්වත්තට සම්බන්ධ කර බෝහිටිය දක්වා ජල මාර්ගය දීර්ඝ කර ගැනීමට පහසුවක් වන බවත්, ප්‍රදේශවාසීන්ගේ ද ඉල්ලීම් පවතින අතර, මෙය ඉටු කර දීමට අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා ඉල්ලා සිටින ලදී.

III. ප්‍රාදේශිය සභා පරිසරය පිළිවෙලකට පැවතිය ද මෙම පරිශ්‍රයේ ඉඩ ප්‍රමාණය හා පහසුකම් පවතින බැවින්, පළතුරු පැළ, විවිධ මල් වර්ග හා පැළ වර්ග සිටුවා ආයතන පරිශ්‍රය තවත් විනිවිද භාවයකින් යුක්තව අලංකාර කර ගනිමු බවත්, ඒ වගේ ම මොනරාගල නගරය මේ වන විට ඉතා හොඳ මට්ටමක පවතින අතර, අදාළ ස්ථාන කිහිපයක් තෝරා ගෙන සැලසුම් සහගතව තවත් අලංකාර පැළ වර්ග සිටුවා පරිසරය අලංකාරව තැබීමට කටයුතු කරමු බවත් , ඒ වගේම නගරයේ ඇති බෝධිය අසල වලවල් හැරී වැසි දිය පිරී තිබුණු ආකාරය තමන්ට නිරීක්ෂණය වූ බැවින්, ඒ සම්බන්ධව ද අවධානය යොමු කරන්න කියාත් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටි අතර, ප්‍රාදේශිය සභා මහජන නියෝජිතයින් වශයෙන් සෑම මොහොතකම ජනතාව වෙනුවෙන් කටයුතු කිරිමේදී මත ගැටුම් ඇති නොකර බොහෝ එකමුතුව නිවැරදි තීන්දු තීරණ ගනිමු බවට ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රීතුමා සියළු දෙනාටම ස්තුතිය පුද කර සිටින ලදී.

**ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම**

- මන්ත්‍රීවරුන් විසින් සභාවෙන් ගත් අත්තිකාරම් මුදල් පියවීමට අවශ්‍ය සහන කාල කීහිපයක් ම ලබාදුන් අතර, තවදුරටත් සහන කාලයක් කිසිසේත්ම ලබා දිය නොහැකි බවත්, ඒ වගේ ම රජයේ

චක්‍රලේඛයන්ට අනුව නිවැරදි තීන්දු තීරණ ගන්නා බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

- ඒ වගේ ම බෝහිටිය ජල ප්‍රශ්නය විසදීම සභාව මගින් තුන් ලක්ෂ ගණනක් වියදම් කර කාණු කපා දුන් අතර, එහි ඉතිරි වැඩ කළ යුත්තතේ ජල සම්පාදන මණ්ඩලයෙන් බවත්, ඊට අමතරව බෝහිටිය පාසල ළඟටත් අතුරු මාර්ගවලටත් ජලය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර දිය හැකි බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

## 8.7 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.බණ්ඩාර මැතිතුමා

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව වැලියාය ආයුර්වේදයේ නේවාසික රෝහල් ගොඩනැගිලි ජනතා අයිතියට පත් කර දීමේ මූලික වැඩ කටයුතු මොනරාගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී කුමාරසිරි රත්නායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පසුගිය දිනක පැවති සාකච්ඡාවකදී තීරණය කර ගත් අතර, ඉදිරි දිනවලදී ඒ සඳහා අවස්ථාව යොදා ගැනෙන බැවින්, එම උත්සවයට පෙර වැලියාය පුස්තකාලය පිටුපස කොටස සභාවේ JCB යන්ත්‍රය යොදවා භූමිය සකස් කර ගත යුතුව ඇති නිසා එය සිදු කර දෙන ලෙසත් ඒ වගේ ම මීට පෙර සභා වාර කිහිපයකදීම සාකච්ඡා කරත් සභාව මගින් අදාළ ආයතන වෙත ඒ බව යොමු කළත් තවමත් එම ස්ථානයට අත්‍යාවශ්‍ය පදික මාරුව සලකුණු කර නොමැති බැවින්, මෙම රෝහල ආරම්භ කිරිමට පෙර හෝ මෙය කඩිනමින් එම ස්ථානයට ලබා දීමට අවශ්‍ය කටයුතු ඉටු කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

II. ඒ වගේ ම නගරයේ අලංකරණය සම්බන්ධව අපි නිරතුරුව කතා කළ යුතු මාතෘකාවක් වශයෙන් පරිසර කමිටුව ඉතා කඩිනමින් පවත්වා මේ සම්බන්ධව සාකච්ඡා කර තීරණයක් ගත යුතු බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටි අතර, ඒ වගේ ම සිරිගල මහ රෝහලේ ගැටළු සම්බන්ධව හැමදාම මේ සභාවේදී කතා කළාට ඒ ප්‍රශ්න එකක්වත් විසදී නොමැති බැවින්, මෙය දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුවට යොමු කර පාර්ලිමේන්තුවේ දී සාකච්ඡා කළ යුතු බැවින්, ප්‍රදේශයේ ඉහළ දේශපාලන අධිකාරිය ප්‍රදේශයේ පවතින මෙවැනි ගැටළු සම්බන්ධව පාර්ලිමේන්තුවේදී හඬක් නගා විසඳුම් ලබාදීම ඔවුන්ගේ යුතුකම හා වගකීම බවත් ජනතාව වෙනුවෙන් ඒවා ඉටු කළ යුතු බව ද ප්‍රකාශ කර සිටින ලදී.

III. විශේෂයෙන් ම ප්‍රාදේශිය සභා මහජන නියෝජිතයින් වශයෙන් ජනතාව වෙනුවෙන් පෙනී සිටීමේදී පෞද්ගලික මතිමතාන්තර හෝ වෙනත් ප්‍රශ්න හෝ මත ගැටුම් ඇති නොකර ගනිමින් ඉතාමත් සාමුහිකව සභාවේ වැඩ කටයුතු නිවැරදිව විනිවිද භාවයකින් යුතුව කර ගෙන යමු බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරමින් සියළු දෙනාටම ස්තුතිය පුද කර සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>

- වැලියාය ආයුර්වේදය අවට පරිශ්‍රය පිරිසිදු කර දීමේ කටයුතු සිදු කර දිය හැකි බවත්, ඒ වගේ ම පදික මාරුව සම්බන්ධව දැනුම් දී ඇති ඇති අතර, එය කෙසේ හෝ සකස් කර දෙන්නම් බවත්, ඒ වගේ ම නගරයේ අලංකරණ හා පිරිසිදු කිරිමේ කටයුතු නිරතුරුවම කර ගෙන යන අතර, ඉදිරියේදී අනෙකුත් සංවර්ධන කටයුතු සියල්ලම සිදු කිරිමට නියමිතව පවතින බවත්, ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

## 8.8 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අජිත් අගලකඩ මැතිතුමා

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව අතුල මන්ත්‍රීතුමා විදුලි බිලක් නොගෙවීම මත විදුලිය විසන්ධි කිරිමක් සම්බන්ධ ප්‍රකාශයක් කර සිටි බැවින්, තමාට ද ඒ බව තොරතුරු ලැබී ඇති බවත්, දින හතක් ඇතුළත විදුලි බිල්පත් ගෙවා නිම කරන ලෙස ට අදාළ ආයතනවලින් පාරිභෝගිකයින් වෙත දන්වා එව්ව ද එම දින හත යන්නට මත්තෙන් ඇවිත් විදුලිය විසන්ධි කර යැමේ ක්‍රමවේදයක් සිදු කර ගෙන යන අතර, ඒ සම්බන්ධව දැනුම් දීමක් හෝ කර බැලීමට අවධානය යොමු කරවන්න කියා ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

II. ඒ වගේ ම සෑම වර්ෂයකම නගරයේ ප්‍රධාන පාසල් දෙකට ළමුන් ඇතුළත් කර ගැනීමේදී ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවීම මත දෙමාපියන් හා දරුවන් මහත් අපහසුතාවයන්ට පත්වන බැවින්, ඉදිරි වර්ෂයේ සිට මෙම ගැටළු නිරාකරණය කර ගත යුතු බැවින්, මේ සම්බන්ධව ඉහළ දේශපාලන අධිකාරිය සමග හෝ සාකච්ඡා කර මේ සඳහා විකල්ප පාසල් හෝ යොදවා පහසුකම් ගොඩ නංවා අවශ්‍ය විසඳුම් ලබා දීමට කටයුතු සලසා දෙන ලෙස ද ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

III. ඒ වගේ ම ගිනි නිවන රථයේ අත්‍යාවශ්‍යතාවය දැඩිව පවතින බැවින්, නව ආණ්ඩුව යටතේ අදාළ අය සමග සාකච්ඡා කර ප්‍රාදේශිය සභාවට ගිනි නිවීමේ රථය කෙසේ හෝ ලබා ගැනීමට පියවර ගන්නා ලෙසට ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රීතුමා සියළු දෙනාට ම ස්තුතිය පුද කර සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>

- ගිනි නිවන රථය ලබා ගැනීමට අවශ්‍ය සියළුම කටයුතු සම්පූර්ණ වෙමින් පවතිද්දී ඇමතිතුමා මාරුවීම මත එය තරමක් පසු බැස්සත්, නව ඇමතිතුමා හරහා එය ලබා ගැනීමට සියල්ල සූදානම් කර ඇති බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.
- ඒ වගේ ම ප්‍රධාන පාසල්වලට ළමුන් ඇතුළත් කර ගැනීමේ ක්‍රමවේදය යටතේ මහජන නියෝජිතයින් වශයෙන් අපත් ඉතාමත් අපහසුතාවයට පත්ව ඇති අතර, මේ වන විට මදුරුකැටිය, විපුලානන්ද හා වැදිකුඹුර විද්‍යාලෝක යන පාසල් ඉදිරියේදී ජාතික පාසල් බවට පත් කිරිමට ශෂීන්ද්‍ර රාජපක්ෂ මැතිතුමා කටයුතු කර ගෙන යන අතර, ඉතා හොඳ විදුහල්පතිවරුන් යටතේ මෙම පාසල් ඉදිරියේදී නගා සිටුවීමට පියවර ගැනීම තුළින් මෙම ගැටළු විසදෙන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

## 8.9 <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ප්‍රදීප් විතානගේ මැතිතුමා</u>

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව සිරිගල රෝහලේ පවතින ගැටළු සම්බන්ධව බොහෝ දෙනෙක් ඉතා කනගාටුවෙන් කතා කළ අතර, ඇත්ත වශයෙන් ම රෝහලේ මෙම සියළු ගැටළුකාරි තත්ත්වයන් මතු වීමට මූලිකම හේතුව වන්නේ සුදුසුකම් නොලත් වැඩ බලන වෛද්‍ය අධිකාරිවරයාගේ ක්‍රියා කලාපය බවත්, මෙතුමා ඉන්නතාක් කල් මෙහි පරිපාලනය දුර්වලව පවතින අතර, කරන්න පුළුවන් එකම විසඳුම වන්නේ ප්‍රදේශයේ ඉහළ දේශපාලන අධිකාරියත් සමග එකතු වී මොහුව මාරු කර යවා සුදුසුකම්ලත් ඉතා හොඳ වෛද්‍ය අධිකාරිවරයෙකු පත් කර එවීමට කටයුතු කිරිම බව පවසමින් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

II. ඒ වගේ ම වැලියාය ආයුර්වේ ද රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලැබීමට ඉදිකර ඇති අංග සම්පූර්ණ රෝහල් ගොඩනැගිල්ල ජනතා අයිතියට පත් කර දීමට මීට පෙර ද අවස්ථා ගණනාවකදීම නොයෙකුත් සාකච්ඡාවන් හරහා තීන්දු තීරණ ගත්ත ද අද වනතුරුත් එය

විවෘත නොකිරිම මත විශේෂයෙන් ම වයෝවෘද්ධ ජනතාව ඉතාමත් පීඩාවට පත්ව සිටින අතර, මෙම සාකච්ඡාවල් කර කර සිටිනවාට වඩා ඉතාමත් කඩිනමින් මෙය විවෘත කර ජනතාවට සහන ලබා ගැනීමට අවස්ථාව සලසා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

III. රටේ පවතින තත්ත්වයත් සමග පවතින විශාල ප්‍රශ්න රාශියක් සමග රටේ අධ්‍යාපනයට ද මෙය විශාල තර්ජනයක් වෙමින් පවතින අතර, බොහෝ දරුවන් ප්‍රමාණයකට ඉගෙනීමට සිදුව ඇත්තේ On line හරහා වීම කනගාටුදායක තත්තවයක් බවත් මේ සඳහා අවශ්‍ය සිග්නල් බොහෝ ප්‍රදේශවලට නිසි පරිදි නොලැබීම මත දරුවන් සහ දෙමාපියන් ඉතා අපහසුතාවයට පත්ව ඇත. විශේෂයෙන් ම වැලියාය, සිරිගල, රත්තනපිටිය, බටුගම්මන ප්‍රදේශවලට කෙසේවත් සිග්නල් නොමැති නිසා තමන් අදාළ ආයතනවලින් මේ සම්බන්ධව සොයා බැලීමේදී සභාව හරහා ඉල්ලීම් කළොත් අදාළ ස්ථාන ආවරණය වන පරිදි සන්නිවේදන කුළුණු ඉදිකළ හැකි බව දන්වා ඇති නිසා සභාව මගින් ඉහළ ආයතනවලින් කඩිනමින් ඉල්ලීම් සිදු කර මේ ගැටළුවට විසඳුමක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

IV. පසුගිය මස ආදාහන කටයුත්තක් වෙනුවෙන් තමන් ආදාහනාගාරය වෙත ගිය බවත්, එම අවස්ථාවේදී මිනිය ගෙනියන්න තිබූ වේලාවට වඩා විනාඩි 10 ක් ප්‍රමාද වී ගිය බවට එතන සිටි සේවකයින් දෙදෙනාගෙන් එක් අයෙකු ඉතාමත් නරක විදිහට බැණ වැදුණු බවත්, තමන්ගේ මැදිහත් වීමෙන් ඒ මොහොතේ එය විසඳා ගත් නමුත් මරණයක් ගෙනියන අයට එසේ බැන වැදීම ඉතාමත් කනගාටුදායක ක්‍රියාවක් බවත්, එලෙසම එතැන සිටි සේවකයින් දෙදෙනාගේ අදාළ නිළ ඇඳුම ඇඳ සිටියේ ද එක් අයෙකු පමණක් බවත්, ඉදිරියේදී මෙවැනි දේවල් සිදු නොවීමට ඔවුන්ට උපදෙස් ලබා දෙන ලෙසත් ප්‍රකාශ කරමින් සියළු දෙනාටම ස්තුතිය පුද කර සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>

- සිරිගල රෝහල් අධිකාරිවරයා විශ්‍රාම යැමට තව බොහෝම කෙටි කාලයක් ඇති නිසා ඔහුව මාරු කර යැවීම අපහසු කටයුත්තක් වන අතර, රෝහලේ ගැටළුව සම්බන්ධව සාකච්ඡා කර කෙසේ හෝ විසඳා ගැනීමට කටයුතු කරමු බවත්, ඒ වගේ ම මෙවර වැලියාය ආයුර්වේදය ආරම්භ කිරිමට සියළුම කටයුතු සූදානම් කර ඇති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.
- ඒ වගේ ම ආදාහනාගාරයේදී එසේ සිදු වීමක් වූවා නම් එය ඉතා වැරදි ක්‍රියාවක් බැවින් ඒ සම්බන්ධව කනගාටුව ප්‍රකාශ කර සිටින බවත්, ඒ සම්බන්ධව සොයා බලා කටයුතු කරන්නම් කියාත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

## 8.10 <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - වයි.උපුල් මැතිතුමා</u>

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව සිරිගල රෝහල සම්බන්ධව බොහෝ දෙනෙක් කතා කළ අතර, රෝහලේ සංවර්ධනයට ඕනෑ තරම් ප්‍රතිපාදන ලැබෙන නමුත් නිසි කළමනාකාරිත්වයකින් නිවැරදි ආකාරයට ඒවා පරිහරණය කිරීමට හොඳ නායකත්වයක් නොමැති වීම මේ සියළු ගැටළුවලට හේතුව බවත්, ඒ වගේ ම විදුලිය විසන්ධි කිරීම සම්බන්ධව කතා කළ අතර, රජයේත් අමාත්‍යාංශවලවත්, පළාත් සභාවේවත් වරදක් නොවන අතර මේ සඳහා එන නිලධාරීන් මානුෂීය නොවන අන්දමින් කටයුතු කිරීම මෙයට හේතුව බවත් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

II. ඒ වගේ ම මදුරුකැටිය ගාමන්ට් එක පසුගිය අවුරුදු 05 තුළම වසා තබා තිබූ අතර, නව ආණ්ඩුව යටතේ අපේ ඉල්ලීමට අනුව මෙය ඉතාමත් විනිවිදභාවයකින් යුතුව ආරම්භ කර ප්‍රදේශයේ බොහෝ පිරිසකට රැකියා අවස්ථා හිමි කරදීම වෙනුවෙන් ඉතාමත් ස්තුතිවන්ත වන බවත්, ඒ වගේ ම විපක්ෂ නායකතුමා සමූපකාර ව්‍යාපාරයේ අඩ පන වීම සම්බන්ධව කතා කළ අතර, මහින්ද මහතාගේ යුගයේදී එදා පරිහානියට පත් වෙමින් තිබූ සමූපකාරය යළි ගොඩ නංවා ඒ හරහා cop city ඇති කර ඉතාමත් දැවැන්ත ලෙස මෙම ව්‍යාපාරය දියුණු කළ අතර, පසුගිය ආණ්ඩුව සමයේදී එය පසු බෑමකට ලක් වුවත් නැවත නව ආණ්ඩුව යටතේ මෙම ව්‍යාපාරය ඉතාමත් දියුණු වෙමින් පවතින බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

III. ඒ වගේ ම නව ආණ්ඩුව යටතේ නව නායකයින් යටතේ අද වන විට දුප්පත්කම නැති කරමින් ගමේ ව්‍යාපාරිකයාට ජාත්‍යන්තර තලයට පවා නැගී සිටීමට අවස්ථාව උදා කර දී ඇති බවත්, ඒ වගේ ම සමෘද්ධි ව්‍යාපාරිකයාට ලක්ෂ ගණනක මුදලක් රජය විසින් වියදම් කරන අතර, විදුලිය නොමැති අඩු ආදායම්ලාභී සියළුම පවුල්වලට නොමිලේ විදුලිය ලබාදීමට මේ වන විට කටයුතු කර ඇති බවත්, රටේ කොතෙකුත් ප්‍රශ්න ඇති වුවත්, අපේ නායකයින් විසින් දැවැන්ත සංවර්ධනයක් කරා රට ගෙන යන බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

IV. ඒ වගේම මොනරාගල නගරය අවට නැවත කොරෝනා රෝගීන් කිහිප දෙනකු හමුවීමට මූලික හේතුව වන්නේ PCR පරීක්ෂණය කිසියම් අයෙකුට කළ පසු එම වාර්තා එනතුරු ඔවුන් නිවසට වී නොසිටීම බැවින් මේ බව අදාළ ආයතන හා නිලධාරීන් දැනුවත් කර වහාම අවශ්‍ය කටයුතු සිදු කරන්න කියාත් ඒ වගේ ම නගරයේ සියළු කටයුතු මේ වන විට ඉතාමත් හොඳින් කර ගෙන යන අතර, ෆෑන් ඒෂියා බැංකුව ළඟින් වම් පැත්තට තියෙන මාර්ගයේ වෙළඳසැල් ටික ඉතාමත් ලස්සනට කර ගෙන යන අතර, තම තමන්ගේ වෙළඳසැල් ඉදිරිපිට අලංකාර මල් පැළ සහිත මල් පෝච්චි 2 බැගින් තැබීමට ඔවුන්ට උපදෙස් ලබාදීම තුළ ඒ සඳහා ඔවුන් පෙළඹෙන බවත් ඒ මගින් කාණු පද්ධතිය ද ආවරණය වී අලංකාරයක් ගෙන දෙන නිසා ඒ සම්බන්ධවත් අවධානය යොමු කර අපේ නගරය අපි අලංකාරව තබා ගනිමු බවත් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

V. ඒ වගේම පොතුවිල් පාරේ පර්චස් තුනේ භූමිය නිරවුල් කර සභාවට පවරා ගැනීමට දැවැන්ත වෙහෙසක් දැරීමට මුල් අවධියේදී සිදුවූ බවත් එම නිසා ජනතාව වෙනුවෙන් වටිනා ඉදිකිරීමක් මෙහි සිදු විය යුතු බවත්, මේ වන තෙක් සභාවෙන් කරපු කිසිදු කටයුත්තකට එරෙහිව ක්‍රියා කර නොමැති බවත්, බහින් බස්වීම් නොමැතිව මේ කෙටි කාලය තුළ ප්‍රදේශයේ අහිංසක අපේ ජනතාව වෙනුවෙන් අපි කටයුතු කරමු බවට ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රීතුමා සියළු දෙනාටම ජය ප්‍රාර්ථනා කර සිටින ලදී.

**ගරු සභාපතිතුමා**

ලබන මස සභා රැස්වීම සිංහල අළුත් අවුරුද්දෙන් පසුව එළඹෙන 19 වන සඳුදා දිනට යොදා ගමු බවට ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කර සිටි අතර, ඒ සඳහා මහ සභාවේ විරුද්ධත්වයකින් තොරව එකඟතාවය ලබා දෙන ලදී.

සභිකවරුන්ගේ වෙනත් කරුණු තවදුරටත් ඉදිරිපත් නොවූ බැවින්, ගරු සභාපතිතුමා විසින් අද දින මාසික මහ සභාව සාර්ථක කර ගැනීමට පැමිණි සියලුම මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටි සියලුම දෙනාට ස්තූතිය පුද කරමින් ගරු සභාපතිතුමා විසින් මහ සභාවේ වැඩ කටයුතු ප.ව.6.30 ට පමණ අවසන් කරන ලදී.

2021.03.17 දින මොනරාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

මෙම සභා වාර්තාව ........................................................................... වන දින පැවැති මහ සභාවේ.......................................................................................................යෝජනාවෙන් සහ..........................................................................................................ස්ථිරත්වයෙන් ඒකමතිකව/ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

- **ගරු සභාපතිතුමන් විසින් හදිසි යෝජනා ඉදිරිපත් කර සිටීම (රීති අංක 11 (8) )**

න්‍යායපත්‍රානුකූලව යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීමෙන් අනතුරුව අද දින සාකච්ඡා කර අනුමැතියක් ගත යුතු හදිසි යෝජනා 01 ක් සම්බන්ධයෙන් මහ සභා අනුමැතිය ලබා ගත යුතු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කළ අතර ඒ සඳහා මහ සභාවේ විරුද්ධත්වයක්ද නොතිබුණු බැවින් ගරු සභාපතිතුමා විසින් එම හදිසි යෝජනා පහතින් දක්වා ඇති ආකාරයට සභාගත කරන ලදි.

a) 2021 වර්ෂයට සභාව සතු සතිපොළ බදු ගත් බදුකරු විසින් ආරම්භක මාසයේ සිට ම රටේ පවතින කොරෝනා වසංගතය හේතුවෙන් සතිපොළ පැවැත්වීම අඩාල වී ඇති අතර, පළමු සතිය තුළ සතිපොළ වසා තබන ලද අතර, දෙවන සතියේ සිට නැවත පොළ විවෘත කළ ද ගොවියන් නිෂ්පාදන රැගෙන ඒම වෙළඳුන්ගේ ප්‍රමාණය සහ සමස්ථ පාරිභෝගිකයන්ගේ පැමිණීම 50%කටත් වඩා අඩු බවත්, නගරයට පැමිණීමට බොහෝ දෙනෙක් අකැමත්තක් දක්වන බැවින් ගොවීන් තම නිෂ්පාදන තම නිවෙස් වෙතින් ම තොග වෙළඳුන්ට විකිණීමේ ක්‍රමවේදයක් ද පවතින නිසා ගිවිසුම්ගත මුදලට සතිපොළ බදු අය කර ගෙන යාම ඉතාමත් අපහසු බැවින්, ගිවිසුම් ප්‍රකාරව මාසිකව සභාවට ගෙවනු ලබන වාරික මුදලින් 50% ක සහන මුදලක් අඩු කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බැවින්, මේ සඳහා මහ සභාවේ තීරණය හා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයසීලන් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම ඉල්ලීමේ යම් සාධාරණත්වයක් පැවතිය ද මේ මොහොතේ මෙම ඉල්ලීම සඳහා මාසික වාරිකයෙන් 50% අඩු කිරීම සම්බන්ධව තීරණයක් ලබා දිය නොහැකි බවත්, ලබන සතියේ ද සතිපොළ පැවැත්වීම හා වෙළඳුන්ගේ පාරිභෝගිකයින්ගේ පැමිණීම සම්බන්ධව සොයා බලා ආදායම් පරීක්ෂක මගින් සම්පූර්ණ වාර්තාවක් ලබා ගැනීම සිදු කළ යුතු බවටත්, ඒ අනුව ඉදිරියේදී තීරණයක් ගැනීම සුදුසු බවටත් මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී. සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.